සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අනාවරණ පරීක්ෂණය 2021

7 ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 නාට්‍යයේ තේමාව යනු,

(i) නාට්‍යයේ නමයි. (ii) නාට්‍යයේ තාලයයි.

(iii) නාට්‍යයේ කියවෙන අදහසයි. (iv) නාට්‍ය පෙන්වන ස්ථානයයි.

02 රංග භූමිය නැතිනම් වේදිකාව යනු,

(i) රංගනය පුහුණුවන ස්ථානයකි. (ii) නාට්‍යයක් රඟදක්වන ඕනෑම ස්ථානයකි.

(iii) සුවිශේෂී පහසුකම් සහිත ස්ථානයකි. (iv) චිත්‍රපට ප්‍රදර්ශනය කරන ස්ථානයකි.

03 අනුකරණය යනු,

(i) ආහාර්ය අභිනයයි.

(ii) එසැණ නිරූපණයයි.

(iii) වෙනත් අයෙකු කරන දෙයක් ඒලෙසටම කිරීමයි.

(iv) වාචික හා සාත්වික අභිනයයි.

04 ''සිරිත් මල්දම'' නිර්මාණය කරණ ලද්දේ,

(i) ඩබ්. ඒ. සිල්වා මහතා විසිනි.

(ii) පාලිත ලොකුපොතාගම මහතා විසිනි.

(iii) භරතමුණිවරයා විසිනි.

(iv) ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමන් විසිනි.

05 ක්ෂණික නිරූපණයක තිබියු යුතු අනිවාර්ය ලක්ෂණයකි

(i) වාචික අභිනයෙන් තොර වීම. (ii) පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කිරීම.

(iii) සබකෝලයෙන් යුතු වීම. (iv) ඒකල ලෙස රඟපෑම.

06 ''ශීථිලකරණය'' යනු,

(i) සීතල ස්ථානයකි. (ii) ශාරීරය සැහැල්ලු කිරීමය.

(iii) පරිකල්පන ශක්තියයි. (iv) ශරීරය දැඩි කර ගැනීමයි.

- **අංක 07 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නොගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

07 ''අමර ගියා දිව්‍යලෝකේ'' යන නාට්‍යයේ සඳහන්වන චරිත වේ.

(i) අම්මා (ii) කුකුල්හාමි (iii) දොස්තර මාමා (iv) පූසා

08 වේදිකා නාට්‍ය ගීතයක් වේ.

(i) අද වෙස්සන්තර රාජ පුතා...... (ii) සුවඳ පද්ම ඕලු ආදී .....

(iii) අයියට නොබැණින් නොගහන් තරහට..... (iv) ඇහැල මලින් පිරිලා.....

09 ඔබට පන්ති කාමර නාට්‍යක් සඳහා පන්ති කාමරය අවටින් සොයා ගත හැකි රංග භාණ්ඩ වේ.

(i) ඉදල (ii) පුටුව (iii) මේසය (iv) පිහිය

10 පරිසරයේ දැකගත හැකි ස්වභාවික සිදුවීම් වේ.

(i) කඳුවැටි අතරින් හිරුපායා ඒම (ii) මුහුදේ නැවක් යාත්‍රා කිරීම

(iii) අහසේ පායා ඇති දේදුන්න (iv) නැගෙන රළ සහිත මුහුදු වෙරළක්

- **අංක 11 සිට 16 දක්වා පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණු ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11 කඳුළු සැලීම ආංගික අභිනයට අයත් වේ. ( )

12 සමතලා භූමි ප්‍රදේශයකින් යුක්ත නොවීම රංග භූමියක මූලික ලක්ෂණයකි. ( )

13 මුහුණේ සියුම් හැඟීම් ප්‍රකාශ කිරීම සාත්වික අභිනය වේ. ( )

14 කනට ඇසෙන මාධ්‍යයන් දෘශ්‍ය මාධ්‍යයන් ලෙස හඳුන්වනු ලැබේ. ( )

15 අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය නාට්‍යමය ලක්ෂණ වේ. ( )

16 ''නම් පොත'' කටහඬ අභ්‍යාසය සඳහා භාවිතා කරණු ලැබේ. ( )

- **අංක 17 සිට 20 දක්වා හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

17 .............................................................................................. ඓතිහාසික කතාවක් පදනම් කරගත් චිත්‍රපටයකි.

18 අලුතින් යමක් සිතීම ................................................................................................................................ යි.

19 ............................................................................................ සිදු කරනු ලබන්නේ වාචික අභිනයෙන් තොරව ය.

20 වේදිකා නාට්‍යයක් සඳහා භාවිතාවන විවිධ කලාවන් ................................................................. ලෙස හැඳින්වේ.

(සිරිපැරකුම්, රූපණය, ආනුෂංගික කලා, පරිකල්පනය, අභිරූපණය)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න ගණන 03 කි)

01 පහත සඳහන් දෙබස් ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| දොස්තර මාමා | : | කෑම ජාති |
| අමර | : | එපා |
| දොස්තර මාමා | : | එහෙනම් මොනවද පුතාට ඕනෑ |
| අමර | : | මට මැරෙන්ඩ ඕනෑ |
| දොස්තර මාමා | : | ඒ මොකටද මැරෙන්නේ ? |

(i) මෙම දෙබස් ඛාණ්ඩය ඇතුළත් නාට්‍ය කුමක් ද? (ල. 02)

(ii) එය රචනා කළ රචකයා කවුරුන් ද? (ල. 02)

(iii) මෙම නාට්‍යයේ එන වෙනත් චරිත 02 ක් ලියන්න. (ල. 02)

(iv) මෙහි එන ''අමර'' මැරෙන්න සිතන්නේ ඇයි ? (ල. 02)

(v) අමර සුව කිරීමට කදිම උපායක් යොදන්නේ කවුද? ඒ කුමක්ද? (ල. 02)

(2 × 5 = 10)


02 (i) ''අභිනය'' යනු කුමක් ද? (ල. 02)

(ii) සතර අභිනය නම් කරන්න. (ල. 04)


(iii) ඔබ කැමති එක් අභිනයක් නම් කර එය කෙටියෙන් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 04)

03

A



B



(i) ඉහත දක්වා ඇති A හා B රූප මොනවාදැයි වෙන වෙනම නම් කරන්න. (ල. 02)

(ii) ඒවා සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ වෙන වෙනම නම් කරන්න. (ල. 04)

(iii) ඉන් එකක් සාදා ගතයුතු ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ල. 04)

04 (i) ඔබ දන්නා රංග අභ්‍යාස 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) රංග අභ්‍යාස කිරීමේ ප්‍රයෝජන 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) පන්ති කාමරය තුළ දී ඔබ සිදුකළ රංග අභ්‍යාසයක් සිදු කළ ආකාරය කෙටියෙන් ලියා දක්වන්න. (ල. 05)

05 (i) ශ්‍රී ලංකාවේ ඓතිහාසික කතා ඇතුළත් ග්‍රන්ථ දෙකක් ලියන්න. (ල. 02)

(ii) මද්දුම බණ්ඩාර, ගෝඨයිම්බරට නම ලැබුණු හැටි, මහින්දාගමනය, කාශ්‍යප රජතුමා, නීල මහා යෝධයාගේ කතාව, දළදාගමනය, ටිකිරි කුමරු, වීර පුරන්අප්පු යන ඓතිහාසික කතා පහත සඳහන් වගුව අනුව වර්ගීකරණය කරන්න. (ල. 04)

| ආගමික කතා | රජකතා කතා | වීර කතා | යෝධයන්ගේ කතා |
|---|---|---|---|
| | | | |

(ii) ඔබ දන්නා ඓතිහාසික කතාවක් කෙටියෙන් ලියන්න. (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 02 | 2 | 03 | 3 | 04 | 4 | 05 | 2 | 06 | 2 | 07 | 2 | 08 | 3 |
| 09 | 4 | 10 | 2 | 11 | ✗ | 12 | ✗ | 13 | ✓ | 14 | ✗ | 15 | ✓ | 16 | ✓ |

17 සිරිපැරකුම් 18 පරිකල්පනය 19 අභිරූපණය 20 ආනුෂංගික කලා (ලකුණු 20)

## II කොටස

01 (i) අමරගියා දිව්‍ය ලෝකේ (ල. 02)

(ii) පාලිත ලොකුපෝතාගම (ල. 02)

(iii) අම්මා / පූසා (ල. 02)

(iv) දිව්‍ය ලෝකේ යාමට (ල. 02)

(v) දොස්තර මාමා. කෘතිම දිව්‍ය ලෝකයක් සෑදීම (ල. 02)

(ලකුණු 10)

02 (i) ඉදිරියට පැමිණවීම. (ල. 02)

(ii) වාචික අභිනය, සාත්වික අභිනය, ආංගික අභිනය, ආහාර්ය අභිනය (ල. 04)

(iii) අදාළ අභිනය නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් මුළු ලකුණු ලබා දෙන්න. (ල. 04)

(ලකුණු 10)

03 (i) A - වෙස් මුහුණ B - මාලය (ල. 02)

(ii) A - කොළපත් හෝ කාඩ්බෝඩ් / අවශ්‍ය වර්ණ / රබර් පටි, ඉලාස්ටික් පටි / වර්ණ කදාසි / ගම්

B - කොඩ්බෝඩ්, බොත්තම් වර්ග, ලී කුඩු, වැලි, කෝඩ් නූල්, ගම්, රෙදි, වර්ණ (ල. 04)

(iii) පියවර දක්වා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ල. 04)

(ලකුණු 10)

04 (i) කටහඬ අභ්‍යාස / ශිථිලීකරණ අභ්‍යාස (ල. 02)

(ii) දෙබස් උච්චාරණය පහසු වීම / මනස නිරවුල් වීම / ශරීරය සැහැල්ලු වීම වැනි අදාළ පිළිතුරක් ලබා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii) රංග අභ්‍යාස සිදු කළ ආකාරය කෙටියෙන් හෝ ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 05)

(ලකුණු 10)

05 (i) මහාවංසය / දීපවංසය / රාජරත්නාකරය / චූලවංසය (ල. 02)

(ii)

| | | |
|---|---|---|
| ආගමික කතා | : | මහින්දාගමනය / දළදාගමනය |
| රජකතා | : | කාශ්‍යප රජතුමා / ටිකිරි කුමරු |
| වීර කතා | : | වීරපුරන් අප්පු/ මද්දුම බණ්ඩාර |
| යෝධයන්ගේ කතා | : | ගෝඨයිම්බරට නම ලැබුනු හැටි / නීල මහා යෝධයාගේ කතාව (ල. 04) |

(iii) කතාව නිවැරදිව ලියා ඇත්නම් අවශ්‍ය ලකුණු ලබා දෙන්න. (ල. 04)

(ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අනාවරණ පරීක්ෂණය 2021

7 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | ප්‍රායෝගික පරීක්ෂණය

01 ගුරුතුමිය ලබාදෙන සංවාද ඛණ්ඩය කියවන්න.
(අමර ගියා දිව්‍යලෝකේ නාට්‍ය පෙළ ඇසුරින්) (ලකුණු 10)

02 පහත වාක්‍ය ඛණ්ඩ හැඟීම් 03 ක් ජනනය වන ආකාරයට ඉදිරිපත් කරන්න.
(තුණ්ඩුවක් දමා අදාළ වාක්‍ය ඛණ්ඩය තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.)

(i) අම්මේ බඩගිනියි
(ii) හරි සනීපයි
(iii) අපෝ ඔයා
(iv) අනේ යන්න
(v) කවුද කීවේ
(vi) ආවද එයා
(vii) දෙනවා දෙකක්
(viii) යන්න මෙතනින් (ලකුණු 10)

03 ඔබ කැමති ඓතිහාසික කතාවක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

04 පහත චරිත අතුරින් එකක් නිරූපණය කරන්න.

(i) මාළු වෙළෙන්දා
(ii) ස්වාමීන් වහන්සේ නමක්
(iii) උමතු ස්ත්‍රීය
(iv) සිඟා කන මිනිසෙක්
(v) වෛද්‍යවරයා
(vi) කෑදර ළමයෙක්
(vii) බස් කොන්දොස්තර
(vii) ගුරුතුමිය (ලකුණු 10)

05 ඔබ කැමති නාට්‍ය ගීතයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)